Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

**7 ශ්‍රේණිය** | වර්ෂ අවසාන පරීක්ෂණය - 2019 | **44 S I**

නැටුම් ( දේශීය) | **කාලය පැය දෙකයි**

නම / විභාග අංකය : ..................................................................................................................

**සැලකිය යුතුයි :-**
- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
- **නිවැරදි පිළිතුර තෝරන්න.**

01. නම්‍යතා අභ්‍යාසවල නිරත වීමේ එක් වැදගත් කමක් වන්නේ,
(i) බර අඩුකර ගැනීම. (ii) ශාරීරික සමබරතාවය.
(iii) බර වැඩිකර ගැනීම. (iv) පැහැපත් සිරුරක් ඇතිකර ගැනීම.

02. උඩරට නර්තනයේ දී හමාර පදය නටනු ලබන්නේ,
(i) වන්නම් නටා අවසානයේ දීය (ii) ගොඩ සරඹයක් නටා අවසානයේ දීය
(iii) පාසරඹයක් නටා අවසානයේ දීය (iv) නම්‍යතා අභ්‍යාස කර අවසානයේ දීය

03. "කුද ගජිත කුද තා" මෙය,
(i) මාත්‍රා 2 + 2 ට අයත් බෙර පදයකි. (ii) මාත්‍රා 2 + 3 ට අයත් බෙර පදයකි.
(iii) මාත්‍රා 2 + 3 ට අයත් කස්තිරමකි. (iv) මාත්‍රා 3 ට අයත් කස්තිරමකි.

04. පංචතූර්ය වාදනයේ "විතතාතය" වර්ගයට අයත් වාද්‍ය භාණ්ඩයකි.
(i) දවුල (ii) ගැටබෙරය (iii) තම්මැට්ටම (iv) උඩැක්කිය

05. දේව යහනක් ඉදිකොට ඒ වෙත දෙවියනට වඩින ලෙස ආරාධනා කරනු ලබන ගායනා විශේෂයකි.
(i) තලමල වරුණ කවි (ii) මල් යහන් කවි
(iii) සිරසපාද කවි (iv) නමස්කාර කවි

- **අංක 6 - 10 දක්වා ඇති ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර ලියන්න.**

06. "උත්සාහය" නැමැති භාවයෙන් ජනිත වන්නේ .............................................. රසයයි.

07. දැල අඩිය යනු උඩරට .............................................. වෙනි සරඹ නාමයයි.

08. තත් ජිත් .............................................. තත් ජිත් තොං නම් තා.

09. මාරි අම්මාන් හා ගංගා අම්මාන් .............................................. නැටුමේ දී පුද ලබයි.

10. රන් තෙලඹුවේ කවි .............................................. නැටුමේ දී ගායනය කරයි.

- **අංක 11 - 15 දක්වා ප්‍රශ්නවල හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද යොදන්න**

11. සච්රිස් සිල්වා මහතා ප්‍රවීන උඩරට නර්තන ශිල්පියෙකි. (........)

12. ආලත්ති අම්මාවරු ගමන් කරනු ලබන්නේ මහනුවර ඇසළ පෙරහැරේදීය. (........)

13. උඩරට හා සබරගමු වන්නම් විනෝදාස්වාදය මුල්කොට රචනා වී ඇත. (........)

14. මඩු බැසීමේ මංගල්‍යය පැවැත්වෙන්නේ පහතරට සාම්ප්‍රදායේදීය. (........)

15. "කප් සිටුවීම" සෑම ශාන්තිකර්මයකම දක්නට ලැබෙන පූර්ව චාර්ත්‍රයකි. (........)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

● **අංක 16 - 20 දක්වා ඇති ප්‍රශ්නවලට වගුවෙන් නිවැරදි පිළිතුර තෝරා තිත් ඉරි මත ලියන්න.**

16. නීතීඥ ජෝන් ද සිල්වා ........................................................................
17. අල් කුර් ආනය ........................................................................
18. වීර පදය ........................................................................
19. ජේ. ඒ. සේදරමන් ........................................................................
20. මර්සලින් ජයකොඩි පියතුමා ........................................................................

| |
|---|
| **ඉස්ලාම් ආගමේ ග්‍රන්ථයකි, කතරගම පෙරහැර, උඩරට නැටුම් කලාව, වෙස්සන්තර නූර්තිය, ගීත රචකයෙකි.** |

## II - කොටස

● **තෝරා ගත් ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු ලියන්න.**

01. i. ඔබ දන්නා ගැමි නැටුම් හතරක් ලියන්න (ල. 02)
 ii. ගැමි නැටුමක දැකිය හැකි සුවිශේෂි ලක්ෂණ දෙකක් ලියන්න (ල. 02)
 iii. ගැමි නැටුම් භාවිත වන අවස්ථා තුනක් හඳුන්වන්න. (ල. 06)

02. i. තුරඟා වන්නමේ බෙර පදය නියමිත තාල රූපයට ප්‍රස්තාර කරන්න (ල. 02)
 ii. "බන්දවාන කුලු" යන කවිය සම්පූර්ණයෙන් ලියන්න. (ල. 02)
 iii. හනුමා වන්නමේ කස්තිරම නිවැරදිව ලියන්න (ල. 06)

03. i. කතරගම පෙරහැරෙහි දක්නට ලැබෙන ද්‍රවිඩ ගැමි නැටුම් දෙකක් හඳුන්වන්න (ල. 04)
 ii. ඒවායෙහි දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ තුනක් ලියන්න. (ල. 06)

04. i. ඔබ ඉගෙන ගන්නා නර්තන සාම්ප්‍රදායේ ප්‍රධාන ශාන්තිකර්මය නම් කරන්න
 ii. එම ශාන්ති කර්මය ප්‍රචලිත ප්‍රදේශ 02 ක් නම් කරන්න
 iii. එහි ප්‍රධාන වාද්‍ය භාණ්ඩයක් නම් කරන්න.
 iv. එහි ප්‍රධාන ඇඳුම් කට්ටලය නම් කරන්න.
 v. එහි ඇති නර්තන අංග දෙකක් ලියන්න (ල. 2 x 5 = 10)

05. රාමසාන් උත්සවය පිළිබඳව හෝ ඔබ උගත් උඩරට නර්තන ශිල්පියෙකු පිළිබඳව කෙටියෙන් හඳුන්වන්න. (ල. 10)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# වර්ෂ අවසාන වාර පරීක්ෂණය - 2019
## නර්තනය - (ප්‍රායෝගික පරීක්ෂණය)

### 7 ශ්‍රේණිය

01. i. කැමති ගායනයක්
    ii. නිර්දේශිත ජන ගායනයක් (ල. 10)

02. ගොඩ සරඹයක් කස්තිරම සමඟ නර්තනය කිරීම (ල. 10)

03. තුරඟා වන්නමේ අලංකාර පදයක් හා කස්තිරම නර්තනය කිරීම (ල. 10)

04. එක් කවියක් ඇසුරින් ගැමි නැටුමක් නර්තනය කිරීම (ල. 10)

05. වෙසක් කැකුලු /වෙස්සන්තර රාජ පුතා / එක් ගීතයකින් එක් කවියකට නර්තන නිර්මාණයක් (ල. 10)

මුළු ලකුණු (50)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# වර්ෂ අවසාන වාර පරීක්ෂණය - 2019
# නර්තනය - පිළිතුරු පත්‍රය

## 7 ශ්‍රේණිය

I - පත්‍රය

01. 2 02. 3 03. 3 04. 1 05. 2

06. වීර 07. පස්වන 08. තකජිත්
09. කරගම් 10. කුලු

11. ✗ 12. ✗ 13. ✓
14. ✓ 15. ✓

16. වෙස්සන්තර තූර්තිය 17. ඉස්ලාම් ආගමේ ග්‍රන්ථයකි
18. කතරගම පෙරහැර 19. උඩරට නැටුම් කලාව
20. ගීත රචකයෙකි

- II - කොටස සඳහා නිවැරදි පිළිතුරු ලියා ඇත්නම් අදාළ ලකුණු දෙන්න